# සීගිරි ගීයෙන් හෙළිවන සමාජයෙහි පවුල් සංස්ථාවේ අඹු-සැමි ඇසුර හා බැඳි සිරිත් විරිත්

**කුමාරසේකර සී.එල්.කේ.එස්.ටී[1], චන්ද්‍රපාල සී.ඩී.ඩී.[2]**

සිංහල සාහිත්‍යාවලියේ සීගිරි ගීවලට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. සීගිරිය නැරඹීමට පැමිණි පිරිස් කැටපත් පවුරෙහි ගී සටහන් තබා තිබේ. මෙම ගී තුළ එම පුද්ගලයන්ගේ විවිධ මනෝභාව හා සමාජ වටපිටාවෙහි තොරතුරු රැසක් අන්තර්ගත ව ඇත. එම නිසා මෙමඟින් තත්කාලීන සමාජ තොරතුරු රැසක් ම අනාවරණය කරගත හැකි ය. සීගිරි ගී ලියැවුණු කාලයෙහි පවුල් සංස්ථාවෙහි අඹු-සැමි ඇසුර හා බැඳි සිරිත් විරිත් පද්ධතිය නිර්මාණය වී තිබුණේ කෙසේ ද? යන්න මෙහි අධ්‍යයන ගැටළුව යි. සීගිරි ගී රචනා වූ සමාජයෙහි පවුල් සංස්ථාවෙහි අඹු-සැමි ඇසුර හා බැඳි සිරිත් විරිත් පිළිබඳ ව විමසා බැලීම හා සීගිරි ගී තුළ ඒවා දක්වා ඇති ආකාරය විමර්ශනය කිරීම මෙම පර්යේෂණයෙහි අරමුණ යි. මේ සඳහා පුස්තකාල ගවේෂණය හා අන්තර්ජාලය භාවිතා කිරීම මඟින් දත්ත රැස් කරගන්නා ලදී. තත්කාලීන සමාජයෙහි අඹු-සැමි ඇසුර සිරිත් විරිත් සම්ප්‍රදායක් මත ගොඩනැඟී තිබූ බව මෙයින් උපකල්පනය කෙරේ. සීගිරි ගී තුළ හමුවන සිරිතක් වශයෙන් 251 වැනි ගීයට අනුව බිරිඳගේ ඍතුවීම පවතින අවස්ථාවල දී ඇය ස්වාමියාට ඇඳෙහි නිදාගැනීමට ඉඩ ලබා දී බිම නිදාගැනීමේ සිරිත පැවත තිබූ බව පෙනේ. එමෙන් ම එකල සමාජ සම්මතය විසින් බහු පුරුෂ සේවනය අනුමත කර නොතිබුණ ද බහු පත්තිනී විවාහය අනුමත කර තිබේ. පළමු බිරිඳගේ අනුදැනුම මත පවුල් සංස්ථාවට අනතුරක් නොවන පරිදි සහකාර අඹුවන් කිහිප දෙනෙකු යටතේ දිවි ගෙවීමට පුරුෂයන්ට හැකි විය. එලෙස ජීවත්වීමේ දී පළමු බිරිඳගේ චිත්ත සන්තානයෙහි ඇතිවෙන ඊර්ෂ්‍යාව මෙන් ම වේදනාව නිරන්තරයෙන් ඇය පෙළීමට ලක්කරවන බව 41 හා 152 වැනි ගී මඟින් පැහැදිලි ය. තත්කාලීන සමාජයෙහි වැන්දඹු කාන්තාව සිය ස්වාමියා වෙනුවෙන් පතිදම් රකිමින් ජීවත් විය යුතු බවට සමාජ සිරිතක් පැවැත තිබේ. එහි දී සැමියා මියගිය පසු වෙනත් පුරුෂයෙකු දෙස බැලීම හා ආභරණ පැළඳීම කාන්තාවට තහනම් විය. එම සම්මතයට පටහැනි කාන්තාව අශ්‍රද්ධාවන්තියක් ලෙස සමාජයෙහි විවේචනයට ලක් විය. ඉන්දීය කාන්තාව මුහුණ දුන් සති පූජාව තරම් බේදනීය බවක් මෙකල නොවුණ ද එම සංකල්පය 406 වැනි ගීයෙන් සිහි වේ. සැමියාහට ආර්ථිකය සවිමත් කිරීමට නොහැකි වූ විට එම අඩුපාඩු මඟහරවා ගැනීමට කාන්තාව ගණිකා වෘත්තියෙහි නියැළී තිබුණත් එම කාන්තාව සමාජයේ දැඩි පිළිකුලට ලක් වූ බව සනාථවන ගී හමුවේ. එමගින් පතිවත රකිමින් ජීවත්වීම සමාජයෙහි ප්‍රබල සිරිතයක් විය. මේ අනුව මෙකල අඹු-සැමි ඇසුර සිරිත් විරිත් පද්ධතියක් මඟින් සුරක්ෂිත වූ සමාජයක් තිබූ බව නිගමනය කිරීමට හැකි ය.

**ප්‍රමුඛ පද** : අභිලේඛන, බිතුලේඛන, අනුරාධපුර යුගය, සංස්කෘතිය, ඉතිහාසය.

[1] භාෂා අධ්‍යයනාංශය, රජරට විශ්වවිද්‍යාලය. tharukaclks@gmail.com